සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்

Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| අනාවරණ පරීක්ෂණය | පැය 02 යි |
| கண்டுபிடிப்பு சோதனை | 02 மணி நேரம் |
| Diagnostic Test | 02 Hour |
| ඉතිහාසය I, II | 09 ශ්‍රේණිය |
| வரலாறு I, II | தரம் 09 |
| History I, II | Grade 09 |

- මෙම ප්‍රශ්න පත්‍රයේ මුළු ප්‍රශ්න සංඛ්‍යාව ප්‍රශ්න 20 කි. සියලු ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
- පහත සඳහන් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු තෝරා හිස්තැන් පුරවන්න.

01) ලංකාවට පැමිණි ප්‍රථම ලන්දේසි දූත කණ්ඩායමේ නායකයා වන්නේ.................................................ය

02) බ්‍රිතාන්‍ය පාලනයෙන් ලංකාවට පත්ව ආ ප්‍රථම බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා.............................................වේ

03) බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයට නායකත්වය ලබාදුන් ඇමෙරිකානු ජාතිකයා වූයේ.................................වේ

04) අවිහිංසාවාදයේ පියා ලෙස හඳුන්වන්නේ.............................................ය

05) ඉන්දියානු නිදහස් සටන් ව්‍යාපාරයේ රැඩිකල් මතධාරියෙකු වන්නේ.................................................ය.

(මහත්මා ගාන්ධි, ජොර්ජ් වැන් ස්පිල්බර්ජන්, බිපන් චන්ද්‍රපාල්, ෆෙඩ්රික් නෝර්ත්, හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා, අනගාරික ධර්මපාල, සුරේන්ද්‍රනාත් බැනර්ජි )

- පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් වරහන් තුළ (√) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද යොදන්න.

06) උඩරට පාලකයෙකු ලන්දේසීන් සමඟ ප්‍රථම වරට ගිවිසුමක් ඇතිකරගත්තේ 1766 දීය. ( )

07) ප්‍රථම වරට කෝපි වතු වගාවක් ලෙස ආරම්භ කරන ලද්දේ ඉංග්‍රීසීන් විසින් වේ. ( )

08) දෙස් විදෙස් වශයෙන් වඩාත් ප්‍රචලිත වූ විවාදය වන්නේ පානදුරා වාදයයි. ( )

09) 1818 නිදහස් සටන ඌව වෙල්ලස්ස සටන යන නමින් ද හඳුන්වයි. ( )

10) මුස්ලිම් ලීගය සඳහා නායකත්වය ලබා දුන්නේ මොහොමඩ් අලි ජින්නාය. ( )

- පහතින් දක්වා ඇති ප්‍රශ්න අංක 11 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

11) ක්‍රි.ව 1782 උඩරට රාජ්‍යය හා ඉංග්‍රීසීන් අතර සිදු වූ දූත ගමන හා බැඳි පිළිතුරු කාණ්ඩය වන්නේ,

i. ජෝන් පයිබස් - කීර්ති ශ්‍රී රාජසිංහ රජු
ii. හියු බොයිඩ් - රාජාධිරාජසිංහ රජු
iii. රොබට් ඇන්ඩෲස් -රාජාධිරාජසිංහ රජු
iv. කලන් අල්බස් - දෙවන විමලධර්මසූරිය රජු

12) මූගල් රාජ වංශය යටතේ ගොඩනැගුණු අධිරාජ්‍යය පරිහානියට පත්වූයේ කවර රජ සමයකදී ද? ,

i. බාබූර් ii. අක්බාර් iii. ෂා ජහන් iv. ඖරංෂේබ්

13) රාම් මෝගන් රෝයි ආගමික පුනරුදය උදෙසා බිහිකල මුල්ම සංවිධානය වන්නේ කුමක්ද?

i. ප්‍රාර්ථනා සමාජය ii. ආර්ය සමාජය iii. බ්‍රහ්මණ සමාජය iv. සිං සභාව

14) බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව උද්ඝෝෂණ ඉදිරියට ගෙනයාම සඳහා පිහිටුවාගත් මුල්ම සංවිධානය කුමක්ද?

i. ලංකා සංගමය ii. හලාවත සංගමය iii. ලංකා ජාතික සංවිධානය

iv. යාපනය සංගමය

15) පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් විසින් ආරම්භ කරන ලද පිරිවෙන වන්නේ,

i. රත්මලාන පරමධම්මචේතිය පිරිවෙන

ii. මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙන

iii. පැපිලියාන සුනේත්‍රාදේවී පිරිවෙන

iv. පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන

16) කුණ්ඩසාලේ කුමාරයා නමින් ප්‍රකටව සිටි උඩරට රජතුමා වන්නේ,

i. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු

ii. ශ්‍රී විජය රාජසිංහ රජු

iii. $ii$ වන රාජසිංහ රජු

iv. රාජාධිරාජසිංහ රජු

17) මෙරට තේ වගාව පිළිබඳ මූලික අත්හදා බැලීම් සිදු කරමින් ප්‍රථම වරට ලූල් කඳුර වතුයායේ තේ වගාවක් ආරම්භ කළ ඉංග්‍රීසි ජාතිකයා වන්නේ,

i. ජෝර්ජ් බර්ඩ් ii. ජේම්ස් ටේලර් iii. රොබට් ඇන්ඩෲස්

iv. විල්බට් හෝර්ටන්

18) "ගිවිසුම අත්සන් කිරීමට පෙර තොපගේ කොඩිය එසවීමට ඉඩ දිය නොහැකිය. එය එසවිය හැක්කේ ගිවිසුම අත්සන් තැබුවායින් පසුවය" මෙම ප්‍රකාශය සිදු කරනු ලැබුවේ,

i. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි ii. වාරියපොල ශ්‍රී සුමංගල හිමි

iii. කඩහපොල හිමි iv. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි

19) නිදහස් ඉන්දියාවේ පළමු අග්‍රාමාත්‍යවරයා වූයේ කවුද?

i. ජවහල්ලාල් නේරුතුමා ii. මහත්මා ගාන්ධි තුමා

iii. සුරේන්ද්‍රනාත් බැනර්ජි මහතා iv. මොහොමඩ් අලි ජින්නා මහතා

20) ඉන්දියානු නිදහස් සටන් ව්‍යාපාරය තුළ "සම්භාවනීය මහල්ලා" යන අන්වර්ථ නාමයෙන් හැඳින්වූයේ කවුරුන්ද?

i. මහත්මා ගාන්ධි ii. සුරේන්ද්‍රනාත් බැනර්ජි

iii. බාල් ගංගාදාර් තිලක් iv. දඩබායි නඖරෝජි

## II කොටස

- පළමු වන ප්‍රශ්නයත් තවත් ප්‍රශ්න හතරකටත් පමණක් පිළිතුරු ලියන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන 05 කි.

1) I ප්‍රශ්නය අනිවාර්ය වේ.

I. ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ හා ලෝක සිතියමේ පහත සඳහන් සියලු ස්ථාන ලකුණු කර නම් කරන්න.

අ) ලංකා සිතියම - මඩකලපුව, මහනුවර, මහවැලි ගඟ, යාපනය, ත්‍රිකුණාමලය, කොළඹ (6×1)

ආ) ලෝක සිතියම - ගෝව, එංගලන්තය, ලිස්බන් වරාය, සුබ පැතීමේ තුඩුව (4×1)

A)



i. රූපයේ දැක්වෙන්නේ කවුරුන්ද?

ii. මෙම රැජින කුමන වංශික කාන්තාවක්ද?

iii. ඇය ඇතුළු පිරිස පිටුවහල් කළ ප්‍රදේශය කුමක්ද? (1×3)

B)



i. රූපයේ දැක්වෙන ස්ථානය කුමක්ද?

ii. මෙම ස්ථානය මුල් වරට ඉදිකළ යුරෝපීය ජාතිය කුමක්ද?

iii. මෙය සංවිධානාත්මක බළකොටුවක් ලෙස ඉදි කළේ කවුද? (1×3)

C)

i. ශ්‍රී ලංකාවේ අවසාන සිංහල රජු කවුරුන්ද?

ii. 1803 උඩරට ආක්‍රමණය මෙහෙය වූ බ්‍රිතාන්‍ය සෙනෙවියා කවුරුන්ද?

iii. 1818 පළමු විමුක්ති අරගලයට නායකත්වය දුන් නායකයා කවුරුන්ද?

iv. ලංකාවේ පොල් පර්යේෂණායතනය පිහිටා ඇත්තේ කුමන ප්‍රදේශයේද?

2) i. ලංකාවේ බලය තහවුරු කර ගැනීමේ අරමුණින් පැමිණි මුල්ම යුරෝපීය ජාතීන් දෙවර්ගය අනුපිළිවෙළින් ලියා දක්වන්න. (ල.2)

ii. ලන්දේසි පාලනය යටතේ ඇතිකළ තෝම්බු වර්ග තුනක් දක්වන්න. (ල.3)

iii. ලන්දේසි පාලනය යටතේ පිහිටුවා තිබුණු අධිකරණ තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල.5)

3) i. ක්‍රි.ව 1797 දී මුහුදුබඩ ප්‍රදේශයේ ඇති වූ කැරැල්ලට බලපෑ ප්‍රධාන බදු වර්ග දෙකක් දක්වන්න. (ල.2)

ii. ක්‍රි.ව 1796 සිට 1815 දක්වා බ්‍රිතාන්‍ය පාලන අවධියේ කැපීපෙනෙන අවස්ථා තුනක් දක්වන්න. (ල.3)

iii. බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ හේතු සාධක තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල.5)

4) i. බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට මුහුදුබඩ ප්‍රදේශවලට පත්ව ආ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරු දෙදෙනෙක් නම් කරන්න. (ල.2)

ii. 1815 උඩරට ගිවිසුමට අත්සන් තැබූ උඩරට රදළ ප්‍රධානීන් තිදෙනෙකු නම් කරන්න. (ල.3)

iii. 1818 නිදහස් සටනට බලපෑ හේතු සාධක 2 ක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල.5)

5) i. 1848 නිදහස් සටනේ නායකයින් දෙදෙනෙකු දක්වන්න. (ල.2)

ii. 1848 නිදහස් සටනට බලපෑ ටොරින්ටන් ආණ්ඩුකාරවරයා විසින් පනවන ලද බදු වර්ග 3 ක් නම් කරන්න. (ල.3)

iii. 1848 නිදහස් සටනට බලපෑ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනා 2 ක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල.5)

6)

i. බ්‍රිතාන්‍යයන් විසින් මෙරට ඇති කරන ලද වාණිජ බෝග 2 ක් නම් කරන්න. (ල.2)

ii. කෝපි වගාවේ දියුණුවට බලපෑ හේතු සාධක 3 දක්වන්න. (ල.3)

iii. a) මුඩුබිම් පනත යනු කුමක්ද? (ල.3)

b) දේශීය කෘෂිකර්මාන්තය බිඳ වැටීමට බලපෑ හේතු 2 ක් දක්වන්න.. (ල.2)

7)

i. මිෂනාරීවරුන් ආගම ප්‍රචාරය සඳහා මුද්‍රණය කරන ලද ප්‍රකාශන දෙකක් දක්වන්න. (ල.2)


ii. මෙරට පවත්වන ලද ප්‍රධාන වාද තුනක් දක්වා ඒවා පැවැත් වූ වර්ෂ ලියා දක්වන්න. (ල.3)

iii. බෞද්ධ පුනර්ජීවනයට ගත් ක්‍රියාමාර්ග තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල.5)

8) i. ඉන්දියාව තුළ බ්‍රිතාන්‍ය බලය තහවුරු කර ගැනීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න. (ල.2)

ii. සිපොයි කැරැල්ලට බලපෑ හේතු සාධක 3 ක් දක්වන්න. (ල.3)

iii. ඉන්දියානු නිදහස් සටනේ කැපී පෙනෙන නායකයන් දෙදෙනෙකු සඳහන් කර ඉන් එක් අයෙකු පිළිබඳ කෙටියෙන් දක්වන්න. (ල.5)


ශ්‍රී ලංකාව